සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

7. 11. 2016 8721 Library

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I | පැය / மணித்தியாலம் / Hours: 1 |

Resource Center R De Mazenod College Kandana

නම/විභාග අංකය ..............................................................

සැලකිය යුතුයි.

I. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.

II. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්න වලදී 1,2,3,4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

III. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

IV. I පත්‍රයේ පිළිතුරු II පත්‍රයේ පිළිතුරු සමඟ අමුණා භාර දෙන්න.

---

1. පුරාණ ගිවිසුමේ ජනවන්දනාවට අදාල නීති නියෝග සඳහන් වී ඇත්තේ
   1. උත්පත්ති පොතේ ය.
   2. ද්විතීය නීති සංග්‍රහයේ ය.
   3. ලෙවී ව්‍යවස්ථාවේ ය.
   4. ගණන් කථාවේ ය.

2. පුරාණ ගිවිසුම ලෙස සලකනු ලබන්නේ......................පිටපතෙන් ලැබී ඇති පොත් හතලිස් හයය. හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,
   1. මැසරොටික්
   2. සෙප්ටුවාජින්ත
   3. ද්විතීය සම්මත
   4. හෙබ්‍රව්

3. "මනුෂ්‍ය පුත්‍රය" මේ පොත අනුභව කර ගොස් ඉශ්‍රායෙල් වංශයට කථා කරන්නැ"යි වදාළ සේක. මෙසේ පවසන ලද්දේ කාහටද?
   1. ක්‍රිස්තුන් වහන්සේට
   2. ස්නාවක ජුවාම් කුමාට
   3. ජෙරමියා දිවැසිවරයාට
   4. එසකියෙල් දිවැසිවරයාට

4.

| ශුභාරංචිය | සංකේතය |
|---|---|
| ශු. මාක් | |
| ශු. මතෙව් | |
| ශු. ලූක් | |
| ශු.ජොහන් | |

ඉහත වගුව සම්පූර්ණ කිරීමට නිවැරදි පිළිතුර වන්නේ,
   1. සිංහයා/ කොටියා/ ගවයා/ රාජාලියා
   2. සිංහයා/ මිනිසා/ ගවයා/ රාජාලියා
   3. සිංහයා/බැටළුවා/ගවයා/ රාජාලියා
   4. සිංහයා/ මිනිසා/ දේවදූතයා/ රාජාලියා

5. මිනිසාගේ උතුම් කම විද්‍යාමාන වන කරුණු වන්නේ,
   A. අමරණීය ආත්මය B. බුද්ධිය C. ජීවන හුස්ම D. නිදහස් කැමැත්ත
   නිවැරදි පිළිතුර වන්නේ,
   1. A,B හා D ය. 2. A,B, හා C ය. 3. A,C හා D ය. 4. B,C, හා D ය.

6. "තියෝපිලස්" යන නාමයෙහි අර්ථය වන්නේ,
   1. දෙවියන් වහන්සේගේ මිත්‍රයා ය.
   2. දෙවියන් වහන්සේගේ ගෝලයා ය.
   3. දෙවියන් වහන්සේගේ දූතයා ය.
   4. දෙවියන් වහන්සේගේ සේවකයා ය.

7. ද්විතීය පාවුළු සංදේශ වන්නේ,

1. එපිස/ ගලාති
2. රෝම/ පිළමොන්
3. එපිස / කොලොස්සි
4. කොලොස්සි /ගලාති

8. එළිදරව් සාහිත්‍යයේ එන බැටළුවා හා මකරා මගින් සංකේතවත් කරන්නේ,

1. සත්‍යය හා අසත්‍යය
2. අහිංසකත්වය හා භයානක කම
3. ජීවිතය හා මරණය
4. ක්‍රිස්තුන් වහන්සේ හා පිඩාකාරි බලවේගය

9. උත්පත්ති පොතෙ හි සර්පයා සංකේතවත් කරන්නෙ,

1. මිනිසාගේ උතුම් කම දක්වීමට ය.
2. මිනිසා තුළ ඇති රුචිය පෙන්වා දීමට ය.
3. මිනිසා තුළ ඇති බලය පෙන්වා දීමට ය.
4. මිනිසා තුළ ඇති දේවත්වය පෙන්වා දීමට ය.

10. දෙවියන් වහන්සේ මිසර වාසීන් මත එවන ලද වසංගත වූයේ,

1. මැසි උවදුර / මැඩි උවදුර / ගව උවදුර
2. කිනිතුලු උවදුර/ ගව උවදුර/ මැඩි උවදුර
3. ගඩු උවදුර / පළගැටි උවදුර / මැසි උවදුර
4. වතුර ලේ වීම/ සනදුරු උවදුර / මැසි උවදුර

11. දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමඟ ඇති කර ගන්නා ලද ගිවිසුමේ බාහිර සලකුණ වන්නේ,

1. දේදුන්න 2. දස පනත 3. චර්මඡේදනය 4. සර්පයා

12. ශුද්ධ වූ සභා මාතාව ජනවන්දනා වසරේ ප්‍රධාන කාල දෙක ලෙස නම් කර ඇත්තේ,

1. ආගමන කාලය හා චාතාරික කාලය
2. ආගමන කාලය හා නත්තල් කාලය
3. ආගමන කාලය හා පාස්කු කාලය
4. චාතාරික කාලය හා පාස්කු කාලය

13. ........................ අනුව ප්‍රාතිහාර්යයන් යනු ස්වභාව ධර්මය තුළ අප දක්නා සත්‍යතාවන්ට පටහැනිව සිදුවන ක්‍රියාවකි. හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,

1. ශුද්ධ වූ අම්බ්‍රෝස් තුමා
2. ශුද්ධ වූ අගුස්තිනු තුමා
3. ශුද්ධ වූ ජෙරොම් තුමා
4. ශුද්ධ වූ පාවුළු තුමා

14. දේව රාජ්‍යය යනු,

1. ස්වර්ගයේ ජීවත් වීමයි.
2. ක්‍රිස්තුන් වහන්සේ තුළ ජීවත් වීමයි.
3. ක්‍රිස්තුන් වහන්සේ සමඟ විසීමයි.
4. දේව කැමැත්තට හා දේව පාලනයට නතුවීමයි.

15. "මගේ ස්වාමිනි, මාගේ දෙවියනි," පවසමින් තම විශ්වාසය ප්‍රකාශ කළේ,

1. ආබ්‍රහම් තුමා 2. ශු.පාවුලු තුමා 3. ශු.පේදුරු තුමා 4. ශු.තෝමස් තුමා

16. ශු.පාවුලු තුමා පළමු වන ධර්මදූත ගමනේ යෙදුන ස්ථාන තුනක් වන්නේ,

1. සිලුකිය/ ලුස්ත්‍රාව/ ඉකෝනිය
2. බෙරියාව/ ඇතැන්ස්/ ජෙරුසලම
3. ග්‍රීසිය/ත්‍රෝවසය/ එපිසය.
4. කොරින්තිය/මසදෝනිය/ ග්‍රීසිය

17. [ .............................. ] →
- ක්‍රිස්තුන් වහන්සේ විසින් ස්ථාපිත කර ඇත.
- ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් මෙහෙයවන සේක.
- දෙවියන් වහන්සේ විසින් තෝරා ගත් ජනතාවකි.

හිස්තැනට නිවැරදි පිළිතුර වන්නේ,

1. ශුද්ධ වූ සභාව
2. පෙන්තකොස්ත සභාව
3. විශ්වීය සභාව
4. ලංකා සභාව

18. ඒකත්වය යනුවෙන් අදහස් කරන්නේ,

A. ශුද්ධ වූ සභාවේ ශුද්ධවන්ත බව
B. ශුද්ධ වූ සභාවේ එකමුතු බව
C. ශුද්ධ වූ සභාවේ අඛණ්ඩ බව
D. ශුද්ධ වූ සභාවේ විශ්වීය බව

නිවැරදි පිළිතුර වන්නේ,

1. A හා B ය 2. B පමණි 3. Bහා C ය 4. C පමණි


19. ශ්‍රී ලංකාවට පැමිණ දේශීය කිතුනු සාහිත්‍යයක් ගොඩ නැගීමට පූරෝගාමී වූ පියතුමා වන්නේ,
1. ගරු මයිකල් රුද්‍රිගු පියතුමා ය.
2. ගරු මර්සලින් ජයකොඩි පියතුමා ය.
3. ගරු ජාකොමේ ගොන්සාල්වේස් පියතුමා ය.
4. ගරු පීටර් පිල්ලේ පියතුමා ය.

20. "ප්‍රසාද ස්නාපනයේ මාර්ගයෙන් ඔබ ශුද්ධාත්මයාණන්ගේ මන්දිරයක් වූයෙහි ය. බරපතල පාපයක් කිරීමෙන් ඒ සා මහත් සම්භාවනීය තැනැත්තෙකු ඔබගේ හෘදයෙන් පළවා නොහරින්න."
මෙසේ ප්‍රකාශ කළේ...
1. ශු. දෙවන ජුවාම් ශුද්ධෝත්තම පියතුමා ය.
2. V වන පාවුලු ශුද්ධෝත්තම පියතුමා ය.
3. 16 වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා ය.
4. ශුද්ධ වූ මහා ලියෝ ශුද්ධෝත්තම පියතුමා ය.

21. පශ්චාත්තාප ක්‍රියා නම්,
A. යාච්ඤාව
B. දන්දීම
C. නිරාහාරශීල රැකීම
D. පසුතැවිලි වීම
නිවැරදි පිළිතුර වන්නේ,
1. A,B හා D ය. 2. A හා C ය.
3. A,B හා C ය. 4. B හා D ය.

22. පූජාප්‍රසාදිවරු කොටස් දෙකකට බෙදිය හැකි ය. ඒවා නම්,
1. රාජගුරු ප්‍රසාදිවරු/පූජාප්‍රසාදිවරු 2. පදවි පූජකවරු / පැවිදි පූජකවරු
3. පූජා ප්‍රසාදිවරු / තේවාචාරිවරු 4. කාදිනල්වරු/ රාජගුරු පූසාදිවරු

23. එක් ස්වාමි පුරුෂයෙකුට එක් භාර්යාවක්ද, එක් භාර්යාවකට එක් ස්වාමි පුරුෂයෙක් ද පමණක් විවාහ කරගත හැකි වීම,
1. ඒකත්වය වේ. 2. අඛන්ඩත්වය වේ. 3. ශුද්ධවත්වය වේ. 4. කතෝලිකත්වය වේ.

24.


ඉහත හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,
1. පැවිදි වේදහාර 2. පූජක ජීවිතයේ ලක්ෂණ
3. මුල් කිතුනු සභාවේ ලක්ෂණ 4. පැවිදි ජීවිතයේ ලක්ෂණ

25. මරිය හමුදාව ආරම්භ කරන ලද්දේ,
1. අති උතුම් ලියෝ ජෝශප් කාඩයින් හිමිපාණන් ය.
2. ෆේඩ්රික් ඕසානම් තුමා ය.
3. ෆ්‍රැන්ක් ඩෆ් මහතා ය.
4. ශුද්ධ වූ තෙරේසා මුනිතුමිය ය.

26. වගා කිරීම සඳහා යෙදෙන හෙබ්‍රව් වචනය වන්නේ "අබාද්" ය. මෙහි ඉරි ඇඳි වචනයේ අර්ථය වන්නේ,
1. වැඩ කරමින් නිර්මාණය කිරීම 2. සංරක්ෂණය කිරීම
3. පාලනය කිරීම 4. මැවිල්ල ආරක්‍ෂා කිරීම

27. "ඔබේ සතුරන්ට ප්‍රේම කරන්න, ඔබට පීඩා කරන්නන් උදෙසා .............කරන්න" හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,
1. මෛත්‍රී 2. වෛර 3. ප්‍රේම 4. යාච්ඤා

28. පැරණි ගිවිසුමේ සාමය සඳහා භාවිතා කරන හෙබ්‍රව් වචනය ශාලොම් ය. ශාලොම් යනු,
1. ඇතුලාන්ත සාමය වේ. 2. ප්‍රේමය වේ. 3. සත්‍යය වේ. 4. නිදහස වේ.

29. ශාරීරික පුන්‍ය ක්‍රියාවකි,
1. දුකින් පෙළෙන්නන් සැනසීම
2. අඥානයන්ට ඉගැන්වීම
3. වැරදි කමා කිරීම
4. වහලුන් නිදහස් කිරීම

30. එක්වරු ශීලයේ පරමාර්ථ වන්නේ,

A. තමන්ගේ පාපවලට වන්දි ගෙවීම

B. නිරාහාරව දින දහයක් සිටීම

C. ආත්ම දමනය පුහුණු කිරීම

D. පාපවලට පසුතැවිලි වීම

මින් නිවැරදි පිළිතුර වන්නේ,

1. A හා B ය. 2. B හා C ය. 3. Aහා C ය. 4. C හා D ය.

31. ප්‍රැන්සිස්කෝ, ජසින්තා හා ලුසී යන තිදෙනාට දේව මාතාවන් දර්ශනය වුයේ,

1. පාතිමා නුවර 2. වේලක්කන්නි ග්‍රාමයේ 3. ලූර්දු නුවර 4. බෙත්ලෙහෙම් නුවර

32. යාම යැඳුම් සම්ප්‍රදාය ජෙරුසලමේ තිබූ බව පැවසුවේ,

1. එජේරියා නැමැත්ති ය 2. ශුද්ධ වූ පේදුරු තුමා

3. සෙකරියස් තුමා 4. ශුද්ධ වූ ලූක් තුමා

33. "සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝ ය, .................හිස් තැනට සුදුසු වාක්‍යය වන්නේ,

1. ඔවුහු දෙවියන් වහන්සේ දකින්නෝ ය.

2. ඔවුහු දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ ය.

3. ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේ ය.

4. ඔවුහු දේශය උරුම කර ගන්නෝ ය.

34. ජීවමාන සාන්තුවරිය ලෙස හඳුන්වන්නේ,

1. ශාන්ත තෙරේසා මුනිතුමිය

2. ශාන්ත සිසිලියා මුනිතුමිය

3. එළිසබෙත් තුමිය

4. ශාන්ත ඇග්නස් මුනිතුමිය

35. පස්වන දේව පනතට විරුද්ධ ක්‍රියා වන්නේ,

A. අන් අයගේ අනාගතය විනාශ කිරීම.

B. කිතුනුවකු ලෙස කිතුනු කමට සාක්ෂි නොදැරීම.

C. ගබ්සා කිරීම.

D. පරිසර දූෂණය.

මින් නිවැරදි පිළිතුර වන්නේ,

1. A හා C ය. 2. A හා D ය. 3. A,Cහා D ය. 4. A,B හා C ය.

36. 19 වන සියවසේ ඇති වූ වේද භේදය වනුයේ,

1. ක්වායටිසම් වේද භේදය 2. එව්ටිකියන් වේද භේදය

3. ඒරියන් වේද භේදය 4. ජන්සෙනියම් වේද භේදය

37. කතෝලික සභා ධර්මෝපදේශ අංක 2705/2706 අනුව භාවනාව යනු,

1. අනුකරණයයි 2. හඹා යාමකි 3. ගවේෂණයකි 4. සොයා යාමකි.

38. ස්වර්ගයේ වැඩ සිටින යාච්ඤාවේ මූලිකාංගයක් වන්නේ,

1. තමන් කැමැති ලෙස හිඳ දෙවියන් වහන්සේට ඇමතීමයි.

2. කථා කරමින්, ඇවිදිමින් දෙවියන් වහන්සේට ඇමතීමයි.

3. නිවැරදි ඉරියව්වෙන් දෙවියන් වහන්සේව ඇමතීමයි.

4. මංගල්‍යයන් අවස්ථා වලදී පමණක් දෙවියන් වහන්සේව ඇමතීමයි.

39. දේව ජනතාව වශයෙන් දෙවිඳුන් පුදන උතුම් ම යාගය .......................වේ.

1. දිව්‍ය පූජාව 2. භක්ති අභ්‍යාස

3. දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව 4. ශුද්ධවූ පැය.

40. "මැරෙන තරමට මාගේ සිත අතිශයින් ශෝකාකුලය මෙහි නැවතී අවදිව සිටින්න" ගෙත්සමෙනි උයනේදී මෙසේ පැවසුවේ කවුරුන් විසින් කා හටද?

1. ජේසුස් වහන්සේ/ පිලාත්ට

2. ජේසුස් වහන්සේ/ ශ්‍රාවකයින්ට

3. ජේසුස් වහන්සේ/ මරියතුමියට

4. ජේසුස් වහන්සේ/ හෙරොද් රජුට

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

8555

7 · 11 · 2016

Library

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: II | පැය / மணித்தியாலம் / Hours: 2 |

Learning Resource Center
R
De Mazenod College
Kandana

නම/විභාග අංකය ..........................................................

**සැලකිය යුතුයි.**

- පළමුවන ප්‍රශ්නයට හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20ක්ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10 යි.

---

1 i. දේව රාජ්‍යය යන්න කරුණු දෙකකින් සනාථ කරන්න.

ii. ඉශ්‍රායෙල් ජනතාවගේ වර්ධනය මර්ධනය කිරීමට මිසරයේ රජතුමා ගත් පියවර දෙකක් ලියන්න.

iii. පදවි පූජක පොරොන්දු දෙක ලියන්න.

iv. ශුද්ධ වූ සභාවේ ශික්ෂා පද දෙක ලියන්න.

v. යාම යැදුමේදී භාවිතා කරන ප්‍රශංසා ගීත දෙකක් ලියන්න.

vi. ශුද්ධ වූ බයිබලයේ සංකේත භාවිතයෙන් ලියා ඇති කෘතීන් දෙක ලියා දක්වන්න.

vii. ශුද්ධ වූ පාවුළු තුමාගේ පළමු වන ධර්මදූත ගමනට සහභාගි වූ දෙදෙනා නම් කරන්න.

viii. ශුද්ධ වූ මැක්ෂිමිලියන් කෝල්බේ මුනිතුමාගේ ආදර්ශ පාඨය ලියන්න.

ix. ස්තෝත්‍ර යාගික පිළිවෙතේ ප්‍රධාන කොටස් දෙක ලියන්න.

x. නික්මයාම පොතේ (20:7) සඳහන්වන ආකාරයට දෙවන දේව පනත නම් කරන්න.

2 i. දේශක දිවැසිවරුන්ගේ වචන හා ක්‍රියා පිළිබඳව ශුද්ධවූ ලියවිල්ලේ ඇති ග්‍රන්ථ දෙක නම් කරන්න.

ii. දිවැසිවරු දිවැස් වැකි කීමේදී භාවිතා කළ තුන් ආකාර පද මාලාව ලියන්න.

iii. . දිවැසිවරුන්ගේ කැඳවීම තුළින් ඔබේ ජීවිතයට ගතහැකි ආදර්ශ 5ක් ලියා විස්තර කරන්න.

3 i. අසීසියේ ශුද්ධ වූ ප්‍රැන්සිස් මුනිතුමා ඉදිරිපත් කළ යාච්ඤාවේ වගන්ති දෙකක් ලියන්න.

ii. සාමය ගොඩ නැගීමට ගත හැකි ක්‍රියා මාර්ග තුනක් ලියන්න.

iii. "සාමය බිහිවන්නේ සහෝදරත්වය මෙන් ම මනුෂ්‍යත්වයේ උතුම්කම ආරක්ෂා වුවහොත් පමණි" බහු ආගමික පරිසරයක ජීවත්වන ඔබ මේ සඳහා ගන්නා ක්‍රියාමාර්ග පහක් ලියා විස්තර කරන්න.

4 i. ජේසුස් වහන්සේ දේව රාජ්‍යයේ වටිනාකම් විස්තර කිරීම සඳහා ඉදිරිපත් කළ උපමා දෙකක් ලියන්න.

ii. ජේසුස් වහන්සේ භාග්‍ය අට තුළින් ඉගැන්වූ දේවරාජ්‍යයේ වටිනාකම් තුනක් ලියන්න.

iii. ශ්‍රී ලංකාවේ සාරධර්ම තුළින් දේවරාජ්‍යයේ වටිනාකම වැඩි දියුණු කිරීමට ඔබට ගත හැකි ක්‍රියාමාර්ග පහක් ලියා විස්තර කරන්න.

5 i. කිතුනු විවාහයේ පරමාර්ථ දෙක ලියන්න.

ii. කතෝලික විවාහයකට ඇති නිත්‍යානුකූල බාධා තුනක් ලියන්න.

iii. සාර්ථක කතෝලික විවාහයක් සඳහා අවශ්‍ය වන දෑ කරුණු පහකින් විස්තර කරන්න.

6 i. ස්වාමිවාක් ආරාධනාවේ ව්‍යුහයේ ලක්ෂණ දෙකක් ලියන්න.

ii. උත්තම පූජක යාච්ඤාවේ මූලික ලක්‍ෂණ තුනක් ලියන්න.

iii. ඔබගේ විභාගයේ ප්‍රතිඵල ලැබුණු පසු ඔබ දෙවි පියාණන්ට කරන ස්තුති කිරීමේ යාච්ඤාවක් වචන පනහකින් පමණ ලියන්න.

7 පහත සඳහන් මාතෘකා දෙකක් තෝරා ගෙන එකකට පේළි දොළහකට නොඅඩු වනසේ කෙටි සටහන් ලියන්න.

1. කතෝලික දහම් පාසල
2. ස්නාවක ජුවාම් තුමා ඉදිරිපත් කළ නව සමාජ ධර්මතා
3. ශුද්ධවූ ලූක් තුමා
4. චතාරික සමය